# 2024-01-24 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

## 01. ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළෙඳ ගිවිසුම අත්සන් කිරීම

සැපයුම් ධාරිතාව වර්ධනය කිරීම, අපනයනාභිමුඛ සෘජු විදේශ ආයෝජන ආකර්ශනය කර ගැනීම සහ ශ්‍රී ලංකාවේ භාණ්ඩ හා සේවා සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොළ ප්‍රවේශය පුළුල් කර ගැනීම ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සඳහා අත්‍යවශ්‍යයෙන් අනුගමනය කළ යුතු උපාය මාර්ගයන් ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව, අග්නිදිග ආසියාතු ජාතීන්ගේ සංගමයෙහි විශාලතම ආර්ථිකයක් සහ විශාලතම බාහිර ආයෝජක රාජ්‍යයක් වන තායිලන්තය සමග නිදහස් වෙළෙඳ ගිවිසුමකට එළඹීම සඳහා සාකච්ඡා ආරම්භ කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් 2018-01-16 දින පැවති රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. සාකච්ඡා ක්‍රියාවලිය අතරතුරදී ජාතික වෙළෙඳ සාකච්ඡා කමිටුව විසින් අදාළ සියලු දේශීය පාර්ශ්වකරුවන් සමග ද අදහස් හුවමාරු කරගෙන ඇත. ශ්‍රී ලංකා සහ තායිලන්ත දෙපාර්ශ්වය අතර පැවති සාකච්ඡා වට නවයකට පසු සකස් කරනු ලැබ ඇති වෙළෙඳාම සහ ආයෝජන වැඩිදියුණු කිරීම, දේශීය නීති හා රෙගුලාසි සඳහා අනුකූලතාව සහ දැනුම් හුවමාරු කිරීම පහසුකරණය ඇතුළුව පූර්විකාව සහ ඇමුණුම් ඇතුළත් පරිච්ඡේද 14කින් සමන්විත සම්පූර්ණ නිදහස් වෙළෙඳ ගිවිසුම් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාව ලැබී තිබේ. ඒ අනුව, යෝජිත ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළෙඳ ගිවිසුම දෙපාර්ශ්වය අතර අත්සන් තැබීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 02. ජර්මානු සංවර්ධන සහයෝගිතාව (GIZ) විසින් ක්‍රියාත්මක කරනු ලබන "තිරසර පරිභෝජන හා නිෂ්පාදන ප්‍රවර්ධන ව්‍යාපෘතිය" යටතේ තාක්ෂණික සහාය ලබාගැනීම

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 12 වන තිරසර සංවර්ධන අභිමතාර්ථය වශයෙන් හඳුනාගෙන ඇති "තිරසර නිෂ්පාදනය සහ පරිභෝජන රටාවන් සහතික කිරීම" යටතේ වන 7 වන තිරසර සංවර්ධන ඉලක්කය ලෙස "ජාතික ප්‍රතිපත්ති හා ප්‍රමුඛතාවලට අනුකූලව තිරසර රාජ්‍ය ප්‍රසම්පාදන භාවිතයන් ප්‍රවර්ධනය කිරීම" ඇතුළත් කරනු ලැබ ඇත. එම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම පිණිස රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියට හරිත සංරචක විධිමත්ව සහ ප්‍රමාණවත්ව අන්තර්ගත කිරීම සඳහා සකස් කරන



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை அவென்யூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු. தொ T - (+94 11) 2515759
ෆැ. தொ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

ලද ජාතික හරිත ප්‍රසම්පාදන ප්‍රතිපත්තියද, විශ්වාසදායී හරිත නිෂ්පාදන හා සේවාවන් හඳුනාගැනීමට පහසුකම් සැලසීම සඳහා සහ වෙළෙඳපොළ තුළ ව්‍යාජ හරිතකරණය අවම කිරීම සඳහා ක්‍රියාත්මක කිරීම පිණිස සකස් කරන ලද පාරිසරික ලේබලකරණය පිළිබඳ ජාතික රාමුවද අමාත්‍ය මණ්ඩලය විසින් මීට පෙර අනුමැතිය ලබා දී තිබේ. එකී ප්‍රතිපත්තීන් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති වැඩසටහන් සඳහා ජර්මානු සංවර්ධන සහයෝගිතාව විසින් ආසියානු රටවල් කිහිපයක දැනට ක්‍රියාත්මක කරනු ලැබ ඇති 'තිරසර පරිභෝජන හා නිෂ්පාදන ප්‍රවර්ධන ව්‍යාපෘතිය' යටතේ තාක්ෂණික සහාය ලබා දීම පිණිස එකඟතාව පළ කර ඇත. ඒ සඳහා පරිසර අමාත්‍යාංශය සහ ජර්මානු සංවර්ධන සහයෝගිතාව අතර ක්‍රියාත්මක කිරීමේ ගිවිසුමකට එළඹීම පිණිස පරිසර අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **ජාතික කුරුඳු පර්යේෂණ සහ පුහුණු මධ්‍යස්ථානය කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා දීම**

2023-09-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් නව දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීම සඳහා 2023-08-14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. දැනට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පවතින ජාතික කුරුඳු පර්යේෂණ සහ පුහුණු මධ්‍යස්ථානය අලුතින් ස්ථාපිත කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ පර්යේෂණ කටයුතු සඳහා නව දෙපාර්තමේන්තුව වෙත පවරා දීම යෝග්‍ය බවට හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, ජාතික කුරුඳු පර්යේෂණ සහ පුහුණු මධ්‍යස්ථානය සහ එහි සියලුම වත්කම් මෙන්ම ජාතික කුරුඳු පර්යේෂණ සහ පුහුණු මධ්‍යස්ථානය විසින් දැනට ක්‍රියාත්මක කරනු ලබන සියලුම කාර්යයන් හා කර්තව්‍යයන් කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා දීම පිණිස කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ Latter - day Saint Charities අතර ඇති කර ගත් සහයෝගිතා ගිවිසුම**

සුෂුම්නාව තුවාල වූ පුද්ගලයන් සඳහා විශේෂ වූ රෝද පුටු සපයා ගැනීම පිණිස සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ Latter-day Saint Charities සංවිධානය අතර එළඹ ඇති ගිවිසුමේ විධිවිධාන පරිදි මේ වන විට රෝද පුටු සහ වෙනත් සංචලන ආධාරක තොගයක් පරිත්‍යාග වශයෙන් ශ්‍රී ලංකාවට ලැබී ඇත. පසුගිය කාලය තුළ මුහුණ දුන් උග්‍ර

පිළිකා ඖෂධ හිඟය සැලකිල්ලට ගෙන, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කරනු ලැබූ ඉල්ලීමක් මත එකී ඖෂධ වර්ග 13ක තොගයක් ද ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සැපයුම්කරුවන් හරහා පරිත්‍යාගයක් ලෙස ශ්‍රී ලංකාව වෙත ලබා දීමට Latter-day Saint Charities සංවිධානය විසින් එකඟතාව පළ කර තිබේ. ඒ අනුව, පිළිගත් ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් අදාළ පරිත්‍යාගය පිළිගැනීම සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ කරුණු මත පදනම්ව ඉදිරි කටයුතු කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දීමට තීරණය කරන ලදී.

## 05. ප්‍රතික්ෂුද්‍රජීවී ප්‍රතිරෝධ සමඟ සටන් කිරීමේ ජාතික ක්‍රමෝපායික සැලැස්ම 2023-2028 ක්‍රියාත්මක කිරීම පිණිස එක්සත් රාජධානියේ ෆ්ලෙමින් අරමුදලේ සහාය ලබා ගැනීම

මනුෂ්‍ය වර්ගයා මුහුණ දෙමින් සිටින ප්‍රධානතම මහජන සෞඛ්‍ය අවදානම් 10 අතුරින් එකක් වශයෙන් ප්‍රතික්ෂුද්‍රජීවී ප්‍රතිරෝධය හඳුනාගනු ලැබ තිබේ. ප්‍රතික්ෂුද්‍රජීවී ප්‍රතිරෝධ බලපෑම මත ඖෂධ ප්‍රතිරෝධක බැක්ටීරියා මඟින් වාර්ෂිකව සෘජුවම මරණ මිලියන 1.27ක් පමණ සිදු වන බවත්, ඖෂධ ප්‍රතිරෝධක බැක්ටීරියා ආශ්‍රිතව වාර්ෂිකව මරණ මිලියන 4.95ක් පමණ සිදු වන බවත් ලෝක සෞඛ්‍ය සංවිධානය 2019 වර්ෂයේදී ඇස්තමේන්තුගත කර ඇත. ඊට අමතරව, ප්‍රතික්ෂුද්‍රජීවී ප්‍රතිරෝධය රටවලට සැලකිය යුතු ආර්ථික පිරිවැයක් ද ඇති කරන බව ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් හඳුනාගෙන තිබේ. එම තත්ත්වය මත එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරනු ලබන ෆ්ලෙමින් අරමුදල ප්‍රදාන වැඩසටහන මඟින් අප්‍රිකාවේ හා ආසියාවේ රටවල් 25කට පමණ ප්‍රතික්ෂුද්‍රජීවී ප්‍රතිරෝධය සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස සහාය දෙනු ලබයි. එකී ප්‍රදාන වැඩසටහන යටතේ ෆ්ලෙමින් අරමුදලේ සහාය ලබා ගනිමින් ප්‍රතික්ෂුද්‍රජීවී ප්‍රතිරෝධ සමඟ සටන් කිරීමේ ජාතික ක්‍රමෝපායික සැලැස්ම 2023-2028 ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 06. විනිමය බිල්පත් ආඥාපනත සඳහා සංශෝධන

දැනට ක්‍රියාත්මකව පවතින 1927 අංක 25 දරන විනිමය බිල්පත් ආඥාපනතේ ඇතැම් විධිවිධාන යම් මතභේදාත්මක කරුණු මතු කර ඇති අතර, එහි තවත් ඇතැම් විධිවිධාන යල් පැන ගොස් ඇත. එබැවින්, ගනුදෙනු කළ හැකි නීත්‍යානුකූල ලේඛන සම්බන්ධ නීතිය පැහැදිලි කිරීම සහ වැඩිදියුණු කිරීම පිණිස විනිමය බිල්පත් ආඥාපනතේ සිදු කළ යුතු

සංශෝධන පිළිබඳව නිර්දේශ ලබා ගැනීම සඳහා ජනාධිපති නීතිඥ නිහාල් ජයවර්ධන මහතාගේ සභාපතිත්වය යටතේ කමිටුවක් පත් කරනු ලැබ ඇත. එකී කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති වාර්තාවේ ඇතුළත් නිර්දේශ මත පදනම්ව 1927 අංක 25 දරන විනිමය බිල්පත් ආඥාපනත සංශෝධනය කිරීම පිණිස පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා සහ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 07. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සඳහා සංශෝධන

නීති ප්‍රමාදයන් හේතුවෙන් බොහෝ විට චූදිතයන්ට හෝ අභියාචකයන්ට ඔවුන්ගේ දඬුවම් කාලයට අමතරව දීර්ඝ කාලයක් බන්ධනාගාරගතව සිටීමට සිදු වීම යුක්ති සහගත නොවන බව හඳුනාගැනීම මත චූදිතයන්/අභියාචකයන් බන්ධනාගාරයේ ගත කළ කාලය, ඔහුගේ දණ්ඩන නියමය යටතේ බන්ධනාගාර ගත කළ යුතු කාලයෙන් අඩු කිරීම පිළිබඳව සලකා බැලීමට හැකි වන පරිදි අපරාධ නඩු විධාන සංග්‍රහයේ 323(5) සහ 333(5) වගන්ති සංශෝධනය කිරීම පිණිස 2023-02-20 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් පනත් කෙටුම්පතක් සකස් කරනු ලැබ ඇති අතර, ඒ සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී ඇත. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව එකී පනත් කෙටුම්පත අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 08. දණ්ඩ නීති සංග්‍රහය සඳහා සංශෝධන

දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය පිළිබඳව නීති සංශෝධනය කිරීම සඳහාත්, ස්ත්‍රී දූෂණය සම්බන්ධ නීතියේ පවතින අඩුපාඩු නිවැරදි කිරීම සඳහා සහ පිරිමි ළමයින් දූෂණය කිරීම සාපරාධී ක්‍රියාවක් බවට පත් කිරීම සඳහාත් දණ්ඩ නීති සංග්‍රහය සඳහා සංශෝධන හඳුන්වා දීම පිණිස 2021-01-18 දින සහ 2021-06-28 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා

නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **කැලණිය බෞද්ධ කාන්තා පුණ්‍යායතන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත**

කැලණිය බෞද්ධ කාන්තා පුණ්‍යායතන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි විසින් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් වශයෙන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. නීති කෙටුම්පත් සම්පාදක විසින් පිළියෙල කරනු ලැබ ඇති මූලික පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6)හි විධිවිධාන පරිදි අදාළ පනත් කෙටුම්පත නිර්දේශ කරමින් පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත**

අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් වශයෙන් හිටපු ජනාධිපති සහ වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. අදාළ පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් විධිමත් පරිදි පිළියෙල කරනු ලැබ ඇති අතර, එකී පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6)හි විධිවිධාන පරිදි එම පනත් කෙටුම්පත නිර්දේශ කරමින් පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**************